# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2140/19 - 2019 සැප්තැම්බර් මස 10 වැනි අඟහරුවාදා - 2019.09.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රේගු නිවේදනයයි**

**ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 03/2019**

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ආර්. එච්. එස්. සමරතුංග,
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2019 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

*ආඥාව*

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මංගල සමරවීර වන මම, 2019 සැප්තැම්බර් මස 11 වැනි දින සිට, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවේ අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ ''අ'' උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවට ද, රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 10 වන දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

1A - PG 4645 — 567 (2019/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | තීරුබදු ප්‍රමාණය සාමාන්‍ය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| **07.13** | | | **පිට කුරුට්ට ඉවත් කළ හෝ නොකළ පියලි කළ හෝ නොකළ හෝ පොතු ගැලවූ වියළි රනිල එළවළු** | | | |
| | | --- | උඳු | | | |
| | 0713.31.21 | ---- | රසායනික පිළියම් කිරීම් මගින් වැපිරීම සඳහා සහතික කරන ලද හා ආහාරයට ගැනීමට නුසුදුසු බවට සලකන බෝංචි වර්ගයේ ඇට | | නිදහස් | කි.ග්‍රෑ. |
| | 0713.31.22 | ---- | පියළි කළ | | 15% | කි.ග්‍රෑ. |
| | 0713.31.29 | ---- | අනෙකුත් | | 15% | කි.ග්‍රෑ. |
| | | | | | | |
| **24.01** | | | **නිෂ්පාදනය නොකළ දුම්කොළ ; දුම්කොළ අපතයන්** | | | |
| | | | | | | |
| | 2401.10 | - | නාරටි නොකැපූ, නොඉරූ, දුම්කොළ | | 85% හෝ කි.ග්‍රෑමයට රු. 165/- | කි.ග්‍රෑ. |
| | 2401.20 | - | සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් නාරටි කැපූ, ඉරූ, දුම්කොළ | | 85% හෝ කි.ග්‍රෑමයට රු. 165/- | කි.ග්‍රෑ. |
| | 2401.30 | - | දුම්කොළ අපතයන් | | 85% හෝ කි.ග්‍රෑමයට රු. 165/- | කි.ග්‍රෑ. |

09 - 862

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.